## රත්නපුර ප්‍රාදේශිය සභාව 2022.12.09 වන දින මහා සභා රැස්වීම

රත්නපුර ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2022.12.09. වන දින පෙ.ව.10.00 ට ගරු උප සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර ප්‍රාදේශීය සභාවේ රැස්වීම් ශාලාවේ දී පැවැත්විණි.

මෙදින රැස්වීම සදහා සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛනය:-

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ජී.ජී.ජානක පුෂ්ප කුමාර මහතා | |
| 02. | එන්.විජය ශ්‍රී ශාන්ත කුමාර මහතා | ගරු උප සභාපති |
| 03 | ටී.ප්‍රේමතිලක මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 04. | රණවක කළුආරච්චි මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 05. | ජී.එච්.රංජිත් ධර්මකීර්ති මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 06. | ටී.ජී.ඉන්ද්‍රාණි මැණිකේ මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 07. | අයි.ඩබ්ලිව් අඛිල රෝෂන් ලක්මාල් මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 08. | ඒ.එම්.සමන් පාලිත විජේරත්න මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 09. | පී.වී.අයි.එල්.විතාරම මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 10. | රොහාන් ශ්‍රියන්ත කුමාර මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 11. | ඒ.එම්.නිලන්ති අමරකෝන් මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 12. | කේ.ජී.එන්.අමරසිංහ මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 13. | කේ.වී.කමනි සේනාධීර මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 14 | කේ.ඒ.ජයරත්න මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 15 | වජිරා නන්දනි මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 16. | ලිලානි චන්ද්‍රතිලක මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 17. | එල්.එම්.තමරා සුභාෂිණී මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 18. | ලලිත් බෝතුංගආරච්චි මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 19. | අනූෂ විරාජ් මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 20. | ජී.අනුර ප්‍රභාත් අමරවංශ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 21. | ඕ.කේ. සුගත් ජයවික්‍රම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 22. | ඩී.නිලන්ති දිපිකා යසරත්න මෙනවිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 23. | මෝහන සුන්දරම් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා/ තුමියන්ලා**

| | | |
|---|---|---|
| 01. | ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක මහතා | ගරු සභාපති |
| 02. | බී.ප්‍රියන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 03. | එම්.ඒ.ඩික්සන් ජයතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 04. | ගෝපාල් තම්බිරාජා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 05. | ආර්.ඒ.පද්මා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 06. | ආර්.බී.නාලක සුදත්සිරි හේමපාල මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 07. | මංජුල ශ්‍රී ලාල් බී ගමගේ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 08. | කේ.නිරෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 09. | ඊ.කේ.ප්‍රියන්ත පෙරේරා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 10. | නිශාන් දමිත් අල්ගම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 11. | උදය කුමාර් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 12. | පී.වී.ඉසුරු ජයලත් විතාරම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 13. | යූ.කේ නන්දාවතී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගීවූනිලධාරීන් :-**

01.එම්.ඒ.කේ.ටී.අමරසිංහ මහත්මිය - ලේකම්

02.ජී.එච්.අයි.ඩී.ආරියමිත්‍ර මිය - සංවර්ධන නිලධාරී

**01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.11.11 වන දින මහා සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, ඒම යෝජනාව සංශෝධනයන්ට යටත්ව ගරු මන්ත්‍රී කේ.ඒ. ජයරත්න මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැයට අදාල ගරු සභාපතිතුමාගේ අයවැය පණිවිඩය අද දින මුලාසනය හොබවන ගරු උපභාපතිතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදී.

**03.ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව ඉදිරියේ තැබීම.**

i. 2023 ජනවාරී මාසයේ පැවැත්වීමට අපේක්ෂා කරනු ලබන පළාත් පාලන ක්ෂේත්‍රයේ කටයුතු කරන නිලධාරීන්ගේ විෂය දැනුම සහ ආකල්ප සංවර්ධනය කිරීම තෙදින වැඩමුළුව දන්වා ඇති ලිපිය. පිළිබදව මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ii. සඳමල්යාය සුබසාධක සංගමය විසින් 2022.12.05 දිනැතිව " සඳමල්යාය -මලංගම මාර්ගයේ කාණු පද්ධතිය සම්බන්ධවයි "නැමති ලිපිය සභාගත කරන ලදී.

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න**

නැත

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

i. සේවා ගිවිසුම් මත සේවයේ යොදවා ඇති සේවකයින්ගේ සේවා ගිවිසුම් 2023.12.31 දක්වා දීර්ඝ කිරීම. සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව , ඒම යෝජනාව ගරු මන්ත්‍රී කේ.ඒ.ජයරත්න මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

- ඩබ්ලිව්. නීලිකා ප්‍රියංගනී මහත්මිය - පුස්තකාල සහයක
- ඩබ්ලිව්.වසන්තසිරි කරුණාතිලක මහතා - මුරකරු
- කේ.ජී.සුජිත් නිශාන්ත මහතා - මුරකරු
- ධනුෂ්ක මනතුංග මහතා - මුරකරු
- ආර්.එල්.ඒ.නුවන් මධුසංඛ රත්නායක මහතා - මුරකරු
- පී.කේ.තරිඳු අශාන් කුමාරසිරි මහතා - මුරකරු
- කේ. සුසිල් කුමාර මහතා - වැඩ ක්ෂේත්‍ර කම්කරු
- ඩබ්.එම්.චමින්ද ප්‍රේමරත්න මහතා - සෞඛ්‍ය කම්කරු
- එච්.වී.චමින්ද උපුල් චන්ද්‍රසේන මහතා - සෞඛ්‍ය කම්කරු
- ජී.වී.නිශාන්ත පෙරේරා මහතා - සෞඛ්‍ය කම්කරු
- ඩබ්.ආර්.එන්.ලීලානන්ද මහතා - සෞඛ්‍ය කම්කරු

ii. කර්මාන්ත සංවර්ධන අධිකාරියේ බලවින්න පෙරනිම් කොන්ක්‍රීට් අංගනය වෙත අයවිය යුතු රු:- 298,140.00 මුදලක් එම ආයතනය වෙත ගෙවීම් කිරීම. අවශ්‍ය බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, මේ සම්බන්ධව සියළුම විස්තර සහිත වාර්තාවක් ලබාගෙන ගෙවීම් කිරීමට කටයුතු කිරීම සුදුසු බව සියළුම මන්ත්‍රී වරුන් විසින් තීරණය කරන ලදී .

iii. බලවන අසපුව අසල, ශ්‍රී පලාබද්දල, රත්නපුර ලිපිනයැති එච්.එම්.ඉන්ද්‍රාණී විජයලතා මහත්මියට නිවස සඳහා අඩි 10ක් දිල සෙවිලි තහඩු 20ක් ලබා දීම සඳහා ඒම යෝජනාව ගරු ආණ්ඩුකාර තුමා වෙත යොමු කර අනුමැතිය ලබාගෙන කටයුතු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, ඒම යෝජනාව ගරු මන්ත්‍රී ලිලානි චන්ද්‍රතිලක මහත්මියගේ ස්ථිරත්වයෙන් ඒකමතකව සභා සම්මත කරන ලදී.

iv. රත්නපුර ප්‍රාදේශීය සභාව සඳහා සූර්ය කෝෂ පැනල ( සෝලා ෆවර් සිස්ටම් ) සවිකිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, ආයතන කිහිපයකින් මිල ගණන් කැඳවා නියමිත පරිදි අදාල සවිකිරීම් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීවරුන් විසින් තීරණය කරන ලදී.

**05:01 හදිසි යෝජනා**

i.ඉන්ධන වියදම් දීමනාවක් වශයෙන් රු:-10000.00ක දීමනාවක් ලබා ගැනීම කේ. සුසිල් කුමාර මහතා (වැඩ ක්ෂෙත්‍ර කම්කරු) විසින් ඉල්ලීම් කර ඇති යෝජනාව ගරු සභාපතිතුමා විසින්ඉදිරිපත් කරන ලද අතර, ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනාව වුයේ ආදායම් පරීක්ෂක ලෙස ස්ථිරව පත් කර ඇති නිලධාරිණිය මේ වන විට ගර්භනි තත්වයේ පසුවන නිසාත්, සභාවට ලැබෙන ආදාම් තත්වය අඩු නොවී පවත්වාගෙන යාම සඳහාත් , මෙම විෂයට අදාල ස්ථිර නිලධාරිණිය නැවත සේවයට පැමිණෙන තෙක් පමණක් කේ.සුසිල් කුමාර මහතා සමඟ ගිවිසුම් ගතව මෙම දීමනාව ඔහු වෙත ලබා දීම සුදුසු බවයි.ඒ අනුව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

ii.2022.12.31 දිනෙන් අවසන් වන වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂන කමිටවු ලෙස පහත සඳහන්

01. ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා - කමිටු සාමාජික
02. ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතා - කමිටු සාමාජික
03. සුරේඛා දමයන්ති මිය - සංවර්ධන නිලධාරී - කමිටු සභාපති
04. ඒ.නිම්මි සමුද්ධිකා මිය - සංවර්ධන නිලධාරී - කමිටු සාමාජික
05. එම්.ඉන්ද්‍රශාන්ත මහතා -කාර්මික නිලධාරී - කමිටු සාමාජික
06. අමානි සුගතදාස මිය - කළ .සේවා නිලධාරී - කමිටු සාමාජික
07. කේ.සුසිල් කුමාර මයා - ආදායම් පරීක්ෂක සහයක - කමිටු සාමාජික
08. කේ.කේ.ඒ.ටී.එස්.රත්නසිරි මහතා - පුස්තකාල සහයක - කමිටු සාමාජික
09. එස්.ඩබ්.එස්.එන්.අමරසිංහ මිය - විමර්ශණ නිලධාරී - පළාත් පාලන කොමසාරිස් කාර්යාලය

ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ඉන්ද්‍රාණී මැණිකේ මහත්මියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

**06.කාරක සභාවල වාර්තා**

2022.12.02 වන දින මුදල් කාරක සභා වාර්තාව අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, ඒම යෝජනාව ගරු මන්ත්‍රී ටී.පේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

මාසික ආදායම් හා වියදම් සාරාංශ වාර්තාව ඉදිරිරිපත් කිරීමට නොහැකි විය.

**08.ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ කතා**

**i. ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් අමරවංශ මහතා**

දකුණු ගිලීමලේ මැදගම ප්‍රදේශයේ පදිංචි ඒ.ඒ සුනිල් මහතාගේ නිවස පසුගිය වර්ෂාව නිසා සම්පර්ණයෙන්ම හානියට ලක්වුණා. මෙම නිවසට උඩින් තිබෙන නිවසේ බැම්ම කඩාගෙන වැටීමෙන් තමයි මෙම නිවස හානියට පත් වුනේ මේ වන විට මොහුගෙ නිවස මුළු මනින්ම සකස් කළ යුතුව තිබෙනවා ඒ වගේ ඉහල නිවසද මේ හේතුවෙන් අවධානමට ලක්ව ඇති බවත් එතුමා පැවසුවේය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පැමිණ පරීක්ෂා කර බලා මේ නිවස අළුතින්ම සකස් කළ යුතු බවට තීරණය කර තිබෙනවා. මෙම කටයුතු කඩිනමින් සිදුකරගැනීම සඳහා සභාවක් විදියට මැදිහත්වීමක් සිදුකල යුතු බව එතුමා පැවසුවේය. මේ සඳහා ප්‍රතිපාදන වෙන්වීම සභාවක් ලෙස කොහොමද දන් නැහැ.නමුත් මේ අවස්ථාවේදී හාල් කිලෝ දහයක් අරන් දුන්නත් ඔවුන්ට වටිනවා.මුළු තැන්ගෙය සම්පුර්ණයෙන් විනාශ වී තිබෙනවා. එහි තිබු ද්‍රව්‍ය මේවන විට විනාශ වී තිබෙන බව එතුමා පැවසුවේය.

පසුගිය සුළං තත්වය හේතුවෙන් වේවැල්වත්ත, රත්ගහ , කැටවල ,ගිලීමලේ ආදී ප්‍රදේශවල විශාල වශයෙන් හානිවෙලා තිබෙනවා.දින ගණනාවකට ලයිට් ලැබෙන එකක් නැහැ. ඒ තරම් විශාල හානියක් සිදුවී තිබෙන බව එතුමා පැවසුවේය. සිවිල් සංවිධාන වල මැදිහත් වීමක් තිබුණොත් මේ අවස්ථාවේ වටිනා බව එතුමා පැවසුවේය.

ඉදිරි වර්ෂ සඳහා නව මන්ත්‍රීවරු ඡන්දයකින් තෝරා පත් කර ගැනීමට අවශ්‍යතාවය එළඹී තිබෙන බවත්,මැතිවරණය කල් නොදමා නියමිත වේලාවට පවත්වන ලෙසත්, කොමසාරිස් පාලනයකට නොයා යුතු බවත් ඡන්දය පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරන ලෙසට තම පක්ෂය බලපෑම් කරන බව එතුමා පැවසුවේය.

**ii. ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත කුමාර් මහතා**

ඊයෙ දිනය තුළ පැවති අධික සුළං තත්වය හේතුවෙන් වතු ආශ්‍රිතව විශාල විනාශයක් සිදුවී තිබෙනවා. මේ වන විට ආරංචි මාර්ග වලට අනුව එක් දරුවෙක්ගේ ඇඟට අධිබලැති විදුලි පද්ධතියක විදුලි කණුවක් කඩා වැටීම හේතුවෙන් මේ වන විට රත්නපුර රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබන බව එතුමා පැවසුවේය.

හපුගස්තැන්න කොට්ඨාශයේ වතු නිවාස එක පෙළට සකස් කර තිබෙන්නේ ඒවා සකස් කර තිබෙන ආකාරය ඉතාම දුර්වල තත්වයක තමයි තිබෙන්නේ මේ වන විට රාත්‍රිය ගත කිරීම පවා ඔවුන්ට අපහසු තත්වයකට පත්ව ඇති බව එතුමා සඳහන් කළේය.

ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ආපදා කළමණා කරණ ඒකකය මේ වතු ආශ්‍රිත නිවාස පිළිබඳව අවධානයක් යොමු කරන්නේ නැහැ ඔවුන්ගේ විෂය පථයට මෙය අයත් නොවන ආකාරයට තමයි වැඩ කටයුතු කරන්නේ නමුත් වතු පරිපාලනයෙන් ද මේ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ ඒ තුළ මොවුන් මහත් අපහසු තාවයට පත්ව ඇති බව එතුමා සඳහන් කළේය. මේ පිළිබඳව සභාවෙන් අවධානය යොමු කර ඔවුන්ට අවශ්‍ය සහන ලබා දීම සඳහා ආපදා කළමනාකරණ ඒකකය වෙතින් විමසීමක් කර මෙයට මැදිහත් වීමක් සිදුකරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

හපුගස්තැන්න ප්‍රදේශයේ සමෘද්ධි ප්‍රතිලාභ බෙදා දීමේදී සිදුවි ඇතැයි පවසන මුල්‍ය වංචාව පිළිබඳව සොයා බැලීම සඳහා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ගරු සභාපතිතුමා විසින් ලිපියක් යොමු කිරීම පිළිබඳව තම ස්තූතිය එල කරන බව එතුමා පැවසුවේය. ඒ වගේම මේ සම්බන්ධව පරීක්ෂන වලදී අවශ්‍ය තොරතරු ලබාදෙමින් අවශ්‍ය සහයෝගය ලබාදෙන බවද එතුමා පැවසුවේය.

ලැබෙන තොරතුරු වලට අනුව මේ අපි සහභාගී වන අවසන් සභාව වන්නටත් පුළුවන් මහජන නියෝජිතයෙකු වශයෙන් ජනතාවගේ ප්‍රශ්ණ සෑම අවස්ථාවකම සභාවේ කතා කලා . ජනතාවගෙන් පත්වුනු මන්ත්‍රීවරයෙක් ලෙස තම කාර්යය භාර්යය හරිහැටි සිදු කළ බව එතුමා පැවසුවේය. ඒ වගේම ලේකම් තුමියටත් කාර්යය මණ්ඩලයටත් හිටපු ලේකම් තුමාට හා තුමියටත් තම කාර්යයන් සඳහා දක්වන ලද සහය වෙනුවෙන් ස්තුතිය එල කිරීම සඳහා අවස්ථාවක් කර ගන්නා බව එතුමා පැවසුවේය. ලැබුණු දේවලට වඩා නොලැබුණු දේවල් වැඩි බවත්, ආපහු ඡන්දයක් තියන අවස්ථාවේදී ජනතාව තේරුම් ගෙන ප්‍රතිචාර දක්වනු ඇතැයිද ඒ අවස්ථාවේදී තමන් කරන ලද කාර්යය භාර්යය පිළිබඳව අවබෝධ කර ගත හැකි බව එතුමා පැවසුවේය. බොහෝ විට ජනවාරි මාසයේත් සභාවක් තිබෙන්නට හැකියාව ඇති නමුත් කෙසේ හෝ සියළුම දෙනාට ස්තුතිය එල කරන බව එතුමා පැවසුවේය.

**iii. ගරු මන්ත්‍රී නිලන්ති අමරකෝන් මහත්මිය**

මං ගියවර සභාවේදීත් කතා කළා මේ වීථි ලාම්පු පිළිබඳව අපේ කොට්ඨාශයේ වීථි ලාම්පු වල බල්බ් නැහැ .ඒවා දාලා දෙන්න කියලා කිව්වත් දාලා දෙන්නෙ නැහැ. මේ වන විට සිරිපා වාරය ආරම්භ වී තිබෙනවා.ඒ නිසා මල්වල හංදියට පෙරහැර අවස්ථාවේදී විදුලිය අවශ්‍ය බව මං සභාපතිතුමාට දැන්වුවා එම අවස්ථාවේදී ලයිට් දෙකක් මට දාලා දුන්නා. ගම්වාසීන් මේ පිළිබඳව ප්‍රියන්ත පෙරේරා, විජය ශ්‍රී ශාන්ත , රංජිත් ධර්මකීර්ති මන්ත්‍රීතුමාලාගෙන් විමසූ අවස්ථාවේදී පවසා ඇත්තේ ඊට වගකීම තියෙන්නේ නිලන්ති මන්ත්‍රීතුමියට බව කියලා තියෙනවා. කමක් නැහැ ඒවා එක එක්කෙනා දකින විදියනෙ.

ගිය වසරේ මං ලයිට් හයක් ඉල්ලුවා අනතුරු දායක ස්ථාන වලට දාන්න තමයි ඉල්ලුවෙ. නමුත් ලබා දුන් නැහැ. ඉල්ලුවාම කිව්වෙ ගෙනාපුවා ඉවරයි ගෙනාවම දෙන්නම් කියලා දැන් සභාව ඉවර වෙන්නත් ලංවෙලා නමුත් තාම ලැබුන් නැහැ. මං අහනවා මේ සැරේවත් මේ වීථි ලාම්පු ටික ලබාදෙනවාද කියලා.
මල්වල පොදු වැසිකිළිය ජනතා අයිතියට පැවරීම සිදුකරන දවසෙත් ගැටළු ඇති වුනා .මෙම වැසිකිළිය ආරම්භක කටයුතු තමන් අතින් වියදම් කර සිදුකළත් , විවෘත කිරිමේ අවස්තාව තමන්ට නොදන්වාම සුදානම් කර තිබු බව එතුමිය සඳහන් කළේය. මෙය ටෙන්ඩර් දාන්න ඕනි කියලා සභාපතිතුමා කිව්වා මං දෙන්නෙක් හොයලා දුන්නා එතනට සේවයට යොදවන්න. නමුත් ඒක සිදුවුනේ නැහැ. මං නම් කියන්නේ මේ පොදු වැසිකිළිය මිනිස්සු අතට පත් කරන්න කියලා ඉල්ලා සිටින බව එතුමිය පැවසුවේය.

**iv. ගරු මන්ත්‍රී ඉන්ද්‍රාණි මැණිකේ මහත්මිය**

සෑම කෙනෙකුටම විථි පහන් ප්‍රශ්ණ තියෙනවා. නමුත් අනෙක් අයට තියෙන ප්‍රශ්ණ නොවෙයි මට තියෙන්නේ වීථි පහන් සවි කරන අනුර මහත්මා වෙනුවට මගේ කොට්ඨාශයේ වීථි පහන් සවිකරන වෙනත් නිලධාරියෙක් ඉන්නවා. ඒක හරිම ගැටළුවක්.මේ අනුර මහත්මාගේ ජීවතයට වුනත් හානියක් වෙන්න පුළුවන් අනුර මහත්මා සවිකරලා එන බල්බ් වෙනත් මාර්ග වලින් වයර් ඇදලා සවි කිරීම් කරනවා. එය අනතුරුදායක බව එතුමිය පැවසුවේය. ඉදිරියේදී එවැනි කටයුතු සිදු නොවිය යුතු බව එතුමිය පැවසුවේය.

**v. ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතා**

ශ්‍රී පාද වාරයත් ආරම්භ වී ඇති නිසා මල්වල වැසිකිළි පද්ධතිය කඩිනමින් සුදුසු ක්‍රමවේදයක් යොදාගෙන කාට හෝ බාර දී එය ජනතාවට පරිහරණය කළ හැකි පරිදි සකස් කරන ලෙස එතුමා පැවසුවේය. මෙම වැසිකිළියට අමතරව තවත් කාමරයක්ද ඇති බැවින් එම ස්ථානය ව්‍යාපාර කටයුත්තකට හෝ ලබා දී කටයුතු කරන ලෙසත් මෙය මහා විශාල කටයුත්තක් නොවන නිසා ලබන සභා වාරයේදීත් කතා කිරීමට ඉඩ නොතබා කටයුතු කරන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

තෙවන පාසැල් වාරය තුළදී ක්‍රීඩා කටයුතු සිදුනොකරන අධ්‍යාපන බලධාරීන්ට කඩිනමින් දන්වා යවන ලෙසත්, මෙම කරුණු සම්බන්ධව කතා කළ යුත්තේ සම්බන්ධිකරණ කමිටු වලදී නමුත් එම කමිටු පසුගිය කාලයේ නොපවත්වන ලද බවත්, මෙම කමිටු පවත්වන ලෙස දන්වා යැවීමට කටයුතු කළයුතු බවත්, එම කමිටු සඳහා සහභාගී නොවීමෙන් ජනතාවගේ ප්‍රශ්ණ කතා කිරීම සඳහා අවස්ථාවක් නොලැබෙන බව එතුමා සඳහන් කළේය.

**vi. ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා**

වීථි ලාම්පු සවි කිරීම අපේ කොට්ඨාශ වලත් සවි කර නැහැ. වැඩි කාලයක් අපිට වීථි ලාම්පු ගැන කතා කිරීමට වෙන්නේ නැහැ ලංකා විදුලි බල මණ්ඩලය තීරණයක් අරන් තියෙනවා අත්‍යාවශ්‍ය ස්ථාන වලට හැර වීථි ලාම්පු සවි කිරීමෙන් වැලකී සිටීමට ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිතව තිබෙනවා. මල්වල සිට මී හිටිය දක්වාම වීථි ලාම්පු ටිකක් හෝ සවි කර තිබෙනවා.එයට ස්තූතිවන්ත විය යුතු බව එතුමා පැවසුවේය.

අනූ හතේ ඉදන්ම මං ඔය මල්වල වැසිකිලිය පිළිබඳව කතා කළා . මේ සභාවේ මාත් බෝතුංග මන්ත්‍රීතුමාත් කතා කලා ශ්‍රී පාද කාලයට හරි අවස්ථාව හදලා දෙන්න ඕනි කියලා. කොට්ඨාශ ක්‍රමය පැමිණීමත් සමඟ මන්ත්‍රීතුමිය මැදිහත්වීමෙන් සභාවේ මුදල් ලක්ෂ හතලිහක් පමණ වැය කරලා මේ වැසිකිළි පද්ධතිය සකස් කලා. ඒ වගේම ඉදිකිරීම් සිදුකරන අවස්ථාවන් කිහිපයකදී කාර්මික නිලධාරී මහතාට මං යෝජනා කළා මේ තුළ ව්‍යාපාරික කටයුත්තක් සඳහාද ඉඩකඩක් වෙන් කරන ලෙසට මේ අයුරින් තමයි සකස් කරලා තියෙන්නේ ඒ වගේම ඉහල මහළය තුළ කායවර්ධන මධ්‍යස්ථානයක් හා තවත් ආයතන කිහිපයක එකතුවක් සකස් කිරීම තමයි . නමුත් මේ සභාවේ මන්ත්‍රීතුමියලා කතා කළාට අවබෝධයකින් කතා නොකරනවා කියලා තමයි මට හිතෙන්නේ මොකද මේ සඳහා සභාවෙන් විශාල මුදලක් වැය කරලා උපාංග සවි කරලා සකස් කර තිබෙන්නේ මේ සඳහා ආරක්ෂාවක් අවශ්‍යයි. මේ සඳහා ටෙන්ඩර් දැන්වීම් දාලා ප්‍රසිද්ධ කළා කාට හෝ ටෙන්ඩර් ගැනීම සඳහා නමුත් කවුරුත් බාර ගත්තේ නැහැ. තාවකාලිකව හෝ කවුරුන් හෝ නිත්‍යානුකූලව බාරගෙන කටයුතු කිරීම සුදුසු බවට සභාවෙන් තීරණයක් ගත්තා නමුත් එයත් ක්‍රියාත්මක වුනේ නැහැ. සභාවේ කම්කරුවෙක් නතර කිරීමටත් කටයුතු කළා නමුත් කුමන හෝ අපහසුතාවයක් නිසා ඔහු එතනින් ඉවත්වෙලා තිබෙනවා.

සභාවේ වත්කමක් නිසා මෙය ආවාට ගියාට එකිනෙකාට දීලා බැහැ. සභාවේ කම්කරුවෙක් හෝ නතර කර විධිමත්ව මේ ශ්‍රී පාද කාලය තුළ හෝ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේනම් වටිනා බව එතුමා පැවසුවේය.

මුදල් කාරක සභාව පිළිබඳව කතා කළ යුතුයි.මුදල් කාරක සභාව පිළිබඳව විවිධ අය චෝදනා කරලා තියෙනවා. කොමසාරිස් වලට වැඩ කරනවා කියලා මං මුදල් කාරක සභාවට පත්වෙච්ච දිනයේ සිට සෑම දිනකම සහභාගී වෙලා තිබෙනවා වාසියට වැඩ කටයුතු කර නැහැ.කොමිස් අරන් නැහැ. මුදල් කාරක සභාවට ඉදිරිපත් කරන සෑම ගෙවීමක් පිළිබඳව අපහැදිලිතාවයක් තිබෙනම් අදාල විෂයන් ගෙන්වලා පැහැදිලි කිරීම කරගෙන තමයි අනුමත කිරීම කරන්නේ. සභාවේ සියළුම මන්ත්‍රීවරුන් නියෝජනය වන පරිදි අප පත්වෙලා තිබෙනවා. නමුත් එයට අසාධාරණයක් වන අයුරින් කටයුතු කර නැති බව එතුමා පැවසුවේය. සභාවෙන් දීමනාවක් ගන්නවානම් ගන්නේ මන්ත්‍රී දීමනාව , ඉන්ධන දීමනාව හා දුරකථන දීමනාව එයට අඩුවක් නොවෙන්නට මං වැඩ කරනවා සභාව දවසට පමණක් පැමිණීම සිදු නොකරන බවත්, අවශ්‍ය සෑම අවස්ථාවක සහභාගී වන බව එතුමා පැවසුවේය. මේ මුදල් කාරක සභවාට පැමිණීම වෙනුවෙන් කිසිදු දීමනාවක් අරන් නැහැ. අපි මේ සභාවේ කාර්යයන් වලට උදව් කරනවා හැර වෙනත් වාසි නොලබන බව එතුමා පැවසුවේය. කවුරුහරි චෝදනා කරනවා නම් මං ඒ සේරම ප්‍රතික්ෂේප කරනවා. මන් ඉදිරියට කවුරුන් හෝ පත් වී එම කාර්යයන් ඉටුකරනු ඇතැයි බලාපොරත්තු වෙන බව එතුමා පැවසුවේය.

මෙම වර්ෂයේ අවසන් සභා වාර්යේදී ඉදිරි වර්ෂයට සුභ පතමින් තම අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

**vii. ගරු මන්ත්‍රී තමරා සුභාෂිණී කරුණාරත්න මහත්මිය**

ඊයේ දිනයේදී ඇතිවූ සුළං හේතුවෙන් මගේ කොට්ඨාශයේ විශාල හානී සිදුව තිබෙනවා. දිමුතු සඳරුවන් කියන අයගේ සම්පූර්ණ වහලය සුළගේ ගිහින් තියෙනවා. කටුමැටි බිත්ති සහිත ගෙයක් මෙවැනි නිවෙස් තිබෙන අය මේ කොට්ඨාශයේ සිටීම පිළිබඳව ඇත්තටම ලැජ්ජාවට කරුණක් බව එතුමිය පැවසුවේය. පළාත් සභාවට හෝ දැනුම් දී නිවස සෙවිලි කර ගැනීම සඳහා මේ දිමුතු සඳරුවන් යන අය වෙත සෙවිලි තහඩු විස්සක්වත් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් එතුමිය ඉල්ලීමක් කරන ලදී.

දමිළ ජනතාව වෙනුවෙන් සහනයක් ලබාදෙන්න කියලා තම්බිරාජා මන්ත්‍රීතුමා හා උදය කුමාර් මන්ත්‍රීතුමාත් සභාවේදී අද මතක් කරන්න කියලා මට දැනුම් දුන්නා ඒ වගේම ඔවුන්ට අද සභාවට එන්නට නොහැකි බව ද දැනුම් දුන් බව එතුමිය පැවසුවේය. අමුණු තැන්න විද්‍යාලයේ පාසලේ ද වහළය සුළගට ගැලවී ගොස් තිබෙනවා. දෙමාපියන් කිහිප දෙනෙක් එකතු වී තමයි එය පිළිසකර කරගෙන තිබෙන්නේ. අමුණු තැන්න කොට්ඨාශය තමයි මගේ පදිංචි ප්‍රදේශය ඒ නිසා මේ ප්‍රදේශයේ ජනතාවගේ විසින් මාගෙන් අසන ප්‍රශ්ණ වලට පිළිතුරු ලබාදෙන්න ඕනි. මං නොදන්න නිසයි අහන්නේ සිල්වර් ලැන්ඩ් ප්‍රදේශයේ කාපට් කරනවායැයි පැවසූ මාර්ගය පිළිබඳව ජනතාව ප්‍රශ්න කරනවා.ඒ නිසා මේ සම්බන්ධව පැහැදිලි කිරීමක් කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

වීථි පහන් සම්බන්ධයෙන් සෑම කෙනෙක්ම කතා කළා .ඇත්තටම මටත් වීථි පහන් ලැබුනේ නැහැ. නමුත් මං එකෝ ෆවර් සමාගමින කතා කරලා වීථි පහන් පහක් පරිත්‍යාග කළා.නමුත් මෙම විදුලි පහන් ටික සවිකර ගැනීම සඳහා විදුලි කාර්මික මහතා සම්බන්ධ කර දීමට අපේ සභාවට නොහැකි වූ බව එතුමිය පැවසුවේය. සභා කාලය අවසන් වීගෙන ආවත් මේ කටයුතු සිදු නොවීම සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරන බව එතුමිය පැවසුවේය.

**viii. ගරු මන්ත්‍රී කේ.ඒ.ජයරත්න මහතා**

මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් කතා කළත් මේ අන්තිම සභා වාරය කියලා එහෙම කියන්නට බැහැ අතිගරු ජනාධිපතිතුමා ගන්නනා ප්‍රතිපත්තිමය තීරණ අනුව ඒවා වෙනස් වෙන්න පුළුවන් ඒ කෙසේ වුනත් මේ සභාවේ සිදුවන කටයුතු සම්බන්ධයෙන් කතා කළොත් වීථි පහන් සම්බන්ධ මල්වල වැසිකිළිය සම්බන්ධව කතා කළා මේ ගැටළු ඇතිවෙලා තියෙන්නේ අවශ්‍ය අවස්ථාවේදී අදාල කාරණය සිදු නොවීම නිසා බව එතුමා පැවසුවේය. මල්වල වැසිකිළි ආරම්භ කිරීමට කටයුතු කළේ බන්දු සභාපතිතුමා සිටින කාලයේ බැකෝ යන්ත්‍රය යොදා ගෙපළ කපන අවස්ථාවේදීත් මට මතකයි. ඊට පස්සේ ලක්ෂ ගාණක් වැය කරලා ගොඩනැගිල්ල හැදුවා මං හිතන්නේ මේ වන විට ලක්ෂ හැත්තෑපහක් පමණ ඒ සඳහා වැයවී ඇති බව එතුමා පැවසුවේය. එම කටයුතු අවසන් අවස්ථාවේම ඉවරයක් කර දැමිය යුතුයි. මේ අප ඉන්නේ පස්වෙනි අවුරුද්ද අදත් කතා කරන්නේ මල්වල වැසිකිළිය පිළිබඳව බව එතුමා පැවසුවේය. වීථි පහන් දුන් නැහැ කියලා කියනවා ඒවා දෙන වෙලාවෙ දෙන ප්‍රමාණය අදාල අයට දුන්නා නම් මේ ගැටළු ඇති නොවන බව එතුමා පැවසුවේය. මේ සභාවට කරන්න තියෙන්නේ මුළු රටේම ප්‍රශ්ණ වලට විසඳුම් සෙවීම නොවෙයි. තම බල ප්‍රදේශයේ ගැටළු තමයි. නමුත් අපි ඉහළ සිටින පිරිස කරන්නේ කුමක්ද යන්නත් විමසිල්ලෙන් සිටිය යුතුයි. ඒ පිරිස් ගන්නා තීන්දු තීරණ අනුව තමයි අපි ගමට ගිහින් වැඩ කරන්නේ . ඒ කෙසේ වෙතත් කරන්න තියෙන පොඩි වැඩ ටික එහෙමම තියෙද්දි මහා ලොකු දේවල් සම්බන්ධව පිඹුරුපත් සකස් කරනවා සභාවෙන් කළයුතු වැඩ පිළිබඳව නමුත් වැඩ ටික එතනමයි. ඒ ඒ ප්‍රශ්ණ සඳහා ඒ අවස්ථාවේදීම විසඳුම් ලබා දෙනවානම් මෙවැනි ගැටළු ඇති නොවන බව ගරු මන්ත්‍රීවරයා පැවසුවේය.
මන්ත්‍රීවරු තිස් හය දෙනාටම මම කියනවා මේ අවුරුදු පහට මොනවද කළේ කියලා ආපසු හැරී බලන්න කියලා. නමුත් මේ අවුරුද දෙක තුනේදී ආපස්සට ගිය බවක් පෙනෙන බව එතුමා සහන් කළේය. ඉදිරියේදී එන සභාවක් කවුරුන් හෝ එන කෙනා ගමට යම්කිසි සේවයක් කරනවා නම් එය අගය කරන බව එතුමා පැවසුවේය.

රටේ ආර්ථිකය කඩා වැටීම හේතුවෙන් තමයි මේ සභාවෙ කටයුතු යම් ප්‍රමාදයක් වී තිබෙන්නේ .නමුත් මේ ආර්ථිකය ගොඩනංවීම සඳහා අවශ්‍ය පියවර ගතයුතු බව එතුමා පැවසුවේය. අපිට ගමට යාමට බැරි තත්වයක් නැහැ. ඒ නිසා ඡන්ද ය තිබුණත් අපිට ගැටළුවක් නොමැති බව එතුමා පැවසුවේය. ලබන්නා වූ නව වසර ගරු සභාපතිතුමා ලේකම් තුමිය අපේ කාර්යය මණ්ඩලය සියළුම දෙනාට හා ගරු මන්ත්‍රීවරුන් සියළුම දෙනාට සුබ නව වසරක් වේවායි පතමින් සියළුම කටයුතු මීට වඩා හොඳින් කර ගෙන යාමට ශක්තිය ධෛර්යය ලැබේවා සුමන සමන් දේවාශිර්වාදය ලැබේවායි පතමින් තම අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

**ix. ගරු මන්ත්‍රී අකිල රෝෂන් ලක්මාල් මහතා**

මගේ කොට්ඨාශයේ පෙරේදා රාත්‍රියේ ඇඩි සුළඟත් සමඟ බොහෝමයක් හානි බවට පත්වී තිබෙනවා පෞද්ගලිකව මටත් හානි වුනා. හෙට්ටිකන්ද, කෙම්පනාවත්ත, බටෙවෙල කොට්ඨාශ වල නිවෙස් වල වහල වලට හා වතුපිටිවලට හානි සිදුවී තිබෙනවා. කොට්ඨාශයේ 2018 වර්ෂයේ අවසානයේ වගේ මතක හැටියට අනතුරු දායක ගස් කැපීම ජංගම වැඩ සටහනක් ආරම්භ කළා නමුත් අදාල අයදුම්පත් ලබා දුන්නත් ඒවා ක්‍රියාත්මක වුනේ නැහැ.මේ අනතුරුදායක තත්වය සිද්ධ වුනාට පස්සේ මිනිස්සු මට කතා කරල කිව්වා බමන්ත්‍රීතුමා අපි ඇප්ලිකේෂන් දැම්මේ 2018 නමුත් අද වෙන කම් එම අනතුරු දායක ගස්

ඉවත් කිරීම සිදුවනේ නැහැ කියලා. සභාපතිතුමනි මෙම ගසක් නිවෙසකට වැටි ජීවිත හානියක් සිදු වුවහොත් සභාවට මුදල් ගෙවා ලබාගත් පෝරමයේ පිටපත් ඒ මිනිස්සු ගාව තියෙනවා යම් අවස්ථාවක් සභාවටත් එවැනි අවස්ථාවකදී වගකීමක් එන බව එතුමා පැවසුවේය.

මම වසර 2011 මේ සභාවට ආවෙ  මම බන්ධු සභාපතිතුමාගෙන් ඉල්ලුවෙ බටේවෙල ජනතාව වීථි පහන දැකලා නැහැ මට වීථි පහන් දෙකක් දෙන්න ඒ මිනිස්සුන්ට මේවා පෙන්නලා පැහැදිලි කරලා දෙන්න කියලා එතුමා පැවසුවේය. එතුමා මට වීථි පහන් තුනක් දුන්නා. නමුත් මේ සභාපතිතුමාගෙන් මං වීථි පහන් ඉල්ලුවාම නැති බව තමයි මට කිව්වෙ. නමුත් මං යම්කිසි සිද්ධියක් හේතුවෙන් බන්ධනාගාරගත කරලා සිටින අවස්ථාවේදී ඇතැම් කොට්ඨාශ වල විශාල විථි පහන් සවි කර තිබූ බව එතුමා පැවසුවේය.

නමුත් මම ජල විදුලි බලාගාර වලින් විදුලි බල්බ ලබා ගත්තා මට දැන් විදුලි බල්බ හා අදාල කට්ටලය තියෙනවා. නමුත් එම ආයතන ඒවා සවි කිරීම සඳහා වයර් ලබා දුන්නේ නැහැ . ඒ නිසා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ වයර් රෝල් පහක් ලබා දෙන්න කියා බව එතුමා පැවසුවේය. එහෙම වුනොත් කොට්ඨාශයේ අදාල  සියළුම තැන්වලට වීථි ලාම්පු සවි කිරීමේ හැකියාව ඇති බව එතුමා පැවසුවේය. සභාවේ විදුලි කාර්මික මහතා විසින් යම් ප්‍රමාණයක් සවි කර දෙනු ලැබුවා එයට ස්තුතිවන්ත වනවා අනෙකුත් බල්බ්ද සවි කරන තෙක් අදාල ආයතන බලා සිටින බව එතුමා පැවසුවේය.ඉතිරි වී තිබෙන බල්බ් ගෙදර තිබෙන බවත්, සවි කිරීමට අවශ්‍ය වයර් නොමැති වීම බව එතුමා පැවසුවේය.

මුදල් කාරක සභා වාර්තා බලද්දි වෙනත් සංවර්න කටයුතු සඳහා ඕන තරම් මුදල් වෙන් කර ඇති බව පේන බවත්,මෙම විථි පහන් ගැනීම සඳහා මුදල් නොමැති බව පිළිගැනීම අපහසු බවද එතුමා පැවසුවේය.
අපි 2018 සිට උත්සහා කරා බල ප්‍රදේශයේ තිබෙන සුසාන භූමි ටික මැන වෙන් කර ගැනීමට. ස්වේච්ඡා සංවිධාන වලින් මැණුම් කටයුතු සඳහා අවශය මුලා සහයද ලබාදීමට කැමැත්ත එල කළා. නමුත් එම කටයුතුත්ත දැනු වසර පහක් ගෙවී ගිහින් තියෙනවා තාම සිදුවී නොමැති බව එතුමා පැවසුවේය.

වේවැල්වත්ත සති පොළක් තිබ්බා නගර මධ්‍යයේ තමයි සතිපොල තිබුණේ.නගර මධ්‍යයෙන් ඉවත් කළ සතිපොල හරියට ක්‍රියාත්මක වුනේ නැහැ. මේ වන විට මිනිසුන් එම නගර මධ්‍යයේ පිහිටි කොටසේ ගොඩනැගිලි සාදා ඇති බව එතුමා පැවසුවේය. මේ තුළින් සභාවට හිමි දේපළ අහිමි වි යන බව එතුමා පැවසුවේය. අපි මේවායින් ඉන්නත් පුළුවන් නොයින්නත් පුළුවන් නමුත් මේවා ආරක්ෂා කළ යුතු බව එතුමා පැවසුවේය.

වැසිකිළි පිළිබඳව සමහරු කතා කලා ඒ වගේම වැසිකිළියක් තමයි වේවැල්වත්තෙත් තියෙන්නේ  මේ වන විට එහි තිබුණු දොරත් ගලවන් ගිහින්, වතුර ටැංකියක් තිබුණා ඒකත් නැහැ. ලක්ෂ 16ක් වියදම් කරලා මහජනතාවගේ මුදල් වැය කරලා හදලා අද වන විට වත් කිසිදු පාවිච්චියයක් නැහැ. ගරු සභාපතිතුමනි මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින අතර, ලබන්නා වූ නව වසර සියළුම දෙනාට සුභම සුභ නව වසරක් වෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් තම අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

**x. ගරු මන්ත්‍රී රංජිත් ධර්ම කීර්ති මහතා**

ඊයේ ඇති වූ ආපදා තත්වය හේතුවෙන් වේවැල්වත්ත , දෙහෙනකන්ද  ප්‍රදේශවල මාර්ග වගට ගස් කඩා වැටීම් සිදු වී හානායට පත්වෙලා තිබෙනවා. ආපදා අංශයට කතා කරලා මේ මිනිසුන්ට විශාල සහන සැලසිය යුතු අවස්ථාවක් බවත්, මේ සම්බන්ධව මං රජයේ නිලධාරීන්ට දුරකථනයෙන් කතා කළත් ඔවුන් දුරකථනයවත් ගත්තේ නැහැ.මං දන්නැහැ ඔවුන්ටත් ආපදා තත්වයක්ද කියලා වේවැල්වත්ත පොලීසියේ නිලධාරීන් පමනයි ඒ අවස්ථාවේදී පැමිණ අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබුවේ. තීනන්දුවක් සභාව විසිරුවා හැරීමට කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තුවක් තියෙනවා අපි සභාවට ආවත් නැතත් රත්නපුර ප්‍රාදේශිය සභාව යම්කිසි ස්ථානයක තියෙනවාට අපි කැමතියි.ඒ වගේම පසුගිය පස්වෙනිදා ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිණිය ආසියානු සංවර්ධන බැංකුව හරහා මුදලක් ලබාගෙන මේ වන විට රත්තුරුගල පාර කාපට් කර අවසන් කර තිබෙනවා. ඒවගේම දෙහෙනකන්ද මාර්ගයේ මිලියන 400ක් වෙන්කරලා එම මාර්ගයේ වැඩ ආරම්භ කරනු ලැබුවා. කි.මී.12ක් කාපට් කිරීම සඳහා. මගේ කොට්ඨාශයේ කි.මී. 2 ව්‍යාපෘතියේ මේ වන විට සිල්වර් ලැන්ඩ් ප්‍රදේශයේ කාපට් කිරීම සඳහා පමණයි තිනේනේ ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය නෙවිත් තිබෙන බව එතුමා පැවසුවේය. මේ වනවිට රටේම ව්‍යාපෘති නවත්තලා තියෙනවා. නමුත් ජනවාරි පෙබරවාරි මාස අහවන විට වගේ මෙම නවතා ඇති මාර්ග පිළිසකර කිරීම් කටයුතු ආරම්භ කරන ඇතැයි බලාපොරොත්තු වන බව එතුමා පැවසුවේය.

මෙම සභාවේ මන්ත්‍රිවරු 36 දෙනෙකු නොයෙකුත් අදහස් හා මතවාද සමගික් අවුරුදු පහකට ආසන්න කාලයක් ගතකළා. මෙම කාලයේදී මම මේ සභාවේ කුමන හෝ කමිටුවක සාමාජිකයෙක් බවට පත්වෙලා තිබෙනවා. මම දැක්කා පසුගිය සභා වාර්තාවේ සඳහන් වෙලා තිබුණා මුදල් කමිටුවේ පිරිස් අතයට ගනුදෙණු වලට වැඩ කරනවා වගේ අදහසක් මං එයට තදින්ම විරුද්ධ වෙනවා. මම ගැන කියනවා නම් මට ලැබුණු ව්‍යාපෘතියක් වෙන කාට හරි දීලා 5-10%අල්ලස් අරන් අරන් නැහැ. එහෙම වුනානම් අවුරුදු 15ක් තිස්සේ දේශපාලනය කරන්නෙත් නැති බව එතුමා පැවසුවේය. එහෙම ගන්න පිරිසුත් ඇති ගන්න බැරි වුනු මන්ත්‍රිවරයෙක්ද දන්නැහැ එවැනි ප්‍රකාශ කරන්නේ යනුවෙන් එතුමා පැවසුවේය. මට හරි කණගාටුයි. එකිනෙකාගේ මතිමතාන්තර අපිට වෙනස් කරන්න බැහැ. නමුත් මට එවැනි චෝදනා

කරන්න බැහැ .මං කිසි කෙනෙක්ගෙන් ප්ලේන්ටියක්වත් බීලා නැහැ රස්සාවක් අරන් දුන්නා කියලා. එහෙම තියෙනවා නම් ඔප්පු කරන ලෙස එතුමා පැවසුවේය.

මල්වල හංදියේ සිරිපා පෙරහර අවස්ථාවට දන්සලක් දුන්නා ඒ අවස්ථාවේදි එම ස්ථානයට ලයිට් දෙකක් අවශ්‍ය බව ගම්වාසීන් දැන්වූවා සභාවෙන් අරන් දෙන්න පුළුවන්ද කියලා. සභාපතිතුමාට ඒබව දැනුම් දුන්නාට පසුව විදුලි කාර්මික නිලධාරී අනුරමල්ලි එවලෙම ඇවිත් ලයිට් සවි කර දීලා ගියා. එයට බොහොම ස්තුති වන්ත වන බවද එතුමා පැවසුවේය.සමන් දෙවියන්ට කළ උපහාරය පිළිබඳව බොහෝම පිං කියලා එතුමා පැවසුවේය.

වේවැල්වත්ත දෙහෙන කන්ද ප්‍රදේශවල සිදුවී ඇති ආපදා තත්වය පිළිබඳව අවධානය යොමු කිරීමට මැදිහත් වීමක් සිදුකර දෙන ලෙසත්, දෙමල ජනතාව විශාල පීඩාවකට පත්වෙලා තිබෙන බව එතුමා පැවසුවේය. නිළධාරීන්ගේ මැදිහත්වීම මේ අවස්ථාවේදී ඇත්තේම නැති තරම් බව එතුමා පැවසුවේය. අදාල ආයතන සම්බන්ධ කරලා කතා කරලා පියවර ගන්න කියලා ඉල්ලීමක් කරන ලදී.

**xi. ගරු මන්ත්‍රී ඉන්දික ලක්ෂ්මන් මහතා**

රත්නපුර ප්‍රාදේශිය සභාව තුළ කොට්ඨාශ වලට විශේෂ තත්වයක් බවත්, මෙම 7 වෙනිදා සිට අද දක්වා මගේ කොට්ඨාශය සඳහා විදුලි විසන්දී වී තිබෙනවා. මාර්ග අවහිරතා ඇතිවෙලා තිබෙනවා. රජයේ නිලධාරීන් ගේ සහයක් නොමැතිව ගම්වාසීන් විසින් එම අවහිරතා ඉවත්කරනු ලැබුවා . නමුත් ගුරුබැවිලාගම.බලකොටුන්න කොට්ඨාශ තුළ මේ වන විට සන්නිවේදන කුළුණු අක්‍රිය වී තිබෙනවා. මේ හේතුව නිසා නිවරදි තොරතුරු ප්‍රාදේශිය ලේකම් කාර්යාල තුළට ලැබීල නැතුව ඇති යන්න එතුමා පැවසුවේය.

මගේ කොට්ඨාශයේ එක් පුද්ගලයෙක් බරපතල තුවාල සහිතව බලංගොඩ රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබන බවත්, නිවාස කිහිපයක් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තියෙනවා අඩක් විනාශ වෙච්ච නිවාස තවමත් ගණනය කර ගැනීමට වත් නොහැකි තත්වයක් තියෙන්නේ මාර්ග අපහසුතා හා සන්නිවේදන දුර්වලතා හේතුවෙන් ඒ පිළිබඳව විශේෂ තත්වයක් සේ සලකා රත්නපුර ආපදා ඒකකයේ පිරිස් මේ පිළිබඳව කඩිනමින් සොයා බැලීම සඳහා යොමු කරවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ඔබතුමාගේ මැදිහත් වීම සිදුකරන ලෙස එතුමා ඉල්ලීමක් කළේය.
මේ සභා වාරය සමහරවිට අනිතිම සභාව වෙන්න පුළුවන්. මම සතුටු වෙනවා මේ වසර පහ තුළ කිසිවෙකුගෙන් සොරකම් කළා වංචා කළා කියලා අහලා නැහැ.එවැනි දේ කරලා නැති බවද එතුමා පැවසුවේය.ලබන්නාවූ 2023 වසර සැමටම සුභ නව වසරක් වේවායි පතමින් තම අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

**xii. ගරු මන්ත්‍රී රණවක කළු ආරච්චි මහතා**

කුඩා තේවතු කාර්යාලය කෑගල්ලට රැගෙන යන බවට වාර්තා වෙනවා. මෙම කාර්යාලය කෑගල්ලට ගෙන යෑම තුළින් කුඩා තේ වතු හිමියන් මහත් අපහසුතාවයකට පත්වන බවත්, මේ සඳහා විශේෂ අවධානය යොමු කර මෙම කාර්යාලය රත්නපුර දිස්ත්‍රික්කයෙන් පිටට ගෙන යෑම වළක්වා ගත යුතු බව එතුමා පෙන්වා දුන්නේය.

**xiii. ගරු උප සභාපති ජී.ජී.ජානක පුෂ්පකුමාර මහතා**

2022 වර්ෂයේ අවසාන සභා වාරය ඒ සඳහා සහභාගී වූ සියළුමදෙනාට ස්තුතිය එල කරන බවද. මේ සභාවේ කතා කරන ලද කාරණා කිහිපයක් වන මල්වල වැසිකිළි පද්ධතිය, වේවැල්වත්ත වැසිකිළි පද්ධතිය ඉතා ඉක්මනින් තීරණයක් ගෙන සතියක් තුළ අවශ්‍ය පියවර ගතයුතු බව එතුමා පැවසුවේය.

ගුරුබැවිලාගම හා ගල්ලැල්ල ප්‍රදේශවල ආපදා තත්වයන් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වාර්තා වීම අඩු බව පැවසුවා ඒ පිළිබඳව සොයා බැලීමක් කිරීමට කටයුතු කරන බවද එතුමා පැවසුවේය.

ගරු සභාපතිතුමා අද දින නොමැති වුවත් තව එක වාරයක් සභාව පවත්වගන්න පුළුවන් වෙයි කියා සිතනවා. සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාම අවුරුදු පහක් තිස්සේ එක්ව කටයුතු කළා .සභා බල ප්‍රදේශය තුළ ඇතිවන ගැටළු වලට විසඳුම් සෙවීම සඳහා ප්‍රශ්ණ ප්‍රමුඛතා ගත කර නොමැති වීම මෙම ගැටළු වලට විසඳුම් නොලැබීමට හේතු වී ඇති බව එතුමා පෙන්වා දුන්නේය.

අද දින මහා සභාවට පැමිණි සියළුම දෙනාට ස්තුතිය එල කරමින් මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

**ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක**
**සභාපති**
**රත්නපුර ප්‍රාදේශිය සභාව**